# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2397/67 – 2024 අගෝස්තු මස 16 වැනි සිකුරාදා – 2024.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟ ඉහළ කෝරළේ සුළු කොට්ඨාසයේ, පිටකන්ද (1054) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කටුකිතුල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක Maha/GIK/2014/536 හා 2018.10.10 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් දැක්වෙන ඉඩම් කොටස්වලට මායිම්:

01. කැබලි අක්ෂර **‘A’** – ගල්පෙතියාය – ප්‍රමාණය: **හෙක්. 8.3740**

උතුරට: හිමිකම් කියන අය නොදන්නා ගල්පෙතියාය; නැගෙනහිරට: හිමිකම් කියන අය නොදන්නා ගල්පෙතියාය සහ ඩී. පී. අමරසේන හිමිකම් කියන ගල්පෙතියාය; දකුණට: මාර්ගය, ඩබ්. පී. ගුනසිංහ සහ ඩබ්. පී. කරුණාපාල හිමිකම් කියන ගල්පෙතියාය සහ හිමිකම් කියන අය නොදන්නා ගල්පෙතියාය; බටහිරට: ආර්. පී. බේබිනෝනා සහ තවත් අය හිමිකම් කියන ගල්පෙතියාය, ඇගිලින් සහ තවත් අය හිමිකම් කියන ගල්පෙතියාය සහ හිමිකම් කියන අය නොදන්නා ගල්පෙතියාය.

02. කැබලි අක්ෂර **‘B’** – ගල්පෙතියාය – ප්‍රමාණය: **හෙක්. 9.0027**

උතුරට, නැගෙනහිරට, දකුණට සහ බටහිරට: හිමිකම් කියන අය නොදන්නා ගල්පෙතියාය.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/2/2011/FR/143.
2024 ජූනි මස 28 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 08 – 0200

1A – G 042494 – 14 (2024/08)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*